37		ස්වදේශ කටයුතු අමාත්‍යාංශය -ලිපිද්‍රව්‍ය	500	500	499	100
		ස්වදේශ කටයුතු අමාත්‍යාංශය -ඉන්ධන	400	400	396	99
		ස්වදේශ කටයුතු අමාත්‍යාංශය -නිල ඇඳුම්	12	12	11	92
		ස්වදේශ කටයුතු අමාත්‍යාංශය -වෙනත්	30	30	28	93
		ස්වදේශ කටයුතු අමාත්‍යාංශය -වාහන අළුත්වැඩියා	360	324	324	100
		ස්වදේශ කටයුතු අමාත්‍යාංශය -යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ	150	110	110	100
		ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - ගොඩනැගිලි හා ඉදිකිරීම්	295	243	243	100
		ස්වදේශ කටයුතු අමාත්‍යාංශය -තැපැල් හා සන්නිවේදන	1,070	1,070	1,058	99
		ස්වදේශ කටයුතු අමාත්‍යාංශය -විදුලිය හා ජලය	200	154	154	100
		ස්වදේශ කටයුතු අමාත්‍යාංශය -බදු කුලී	3,936	3,936	3,929	100
		ස්වදේශ කටයුතු අමාත්‍යාංශය -වෙනත්	105	105	103	98
		ස්වදේශ කටයුතු අමාත්‍යාංශය -දේපල ණය පොලී	1,708	1,708	1,692	99
		ගොඩනැගිලි හා ඉදිකිරීම්	80	0	0	0
		යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ	80	51	51	100

		වාහන	120	84	84	100
		ගෘහ භාන්ඩ හා කාර්යාලීය උපකරණ	988	691	691	100
		යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ	40	0	0	0
		රාජ්‍ය ආරක්ෂක හා ආපදා අමාත්‍යාංශය-වැටුප්	7,325	7,325	7,160	98
		රාජ්‍ය ආරක්ෂක හා ආපදා අමාත්‍යාංශය-දීමනා	2,289	2,289	2,287	100
		රාජ්‍ය ආරක්ෂක හා ආපදා අමාත්‍යාංශය-ගමන් වියදම්	432	261	261	100
		රාජ්‍ය ආරක්ෂක හා ආපදා අමාත්‍යාංශය-ලිපිද්‍රව්‍ය	87	87	86	99
		රාජ්‍ය ආරක්ෂක හා ආපදා අමාත්‍යාංශය-වාහන අළුත්වැඩියා	196	196	196	100
		කඩිනම් සහන සැලසීම	3,647	3,106	3,101	100
		නිවාස හා දේපල තක්සේරු කිරීම වෙනුවෙන් නිලධාරීන් සඳහා දීමනා ගෙවීම	224	224	224	100
		නාය යෑම් හා නාය යාමේ අධි අවධානම් ප්‍රදේශවල පවුල් නැවත පදිංචි කිරීම	19,300	14,301	13,671	96
		නැවත පදිංචි කිරීම	60,000	47,940	40,540	85
		හදිසි ආපදාවන්හිදි සුරක්ෂිත මධ්‍යස්ථාන පිහිටුවීම	1,940	1,940	970	50
		ස්වභාවිද ආපදා දේපල හානි වන්දි	35,421	32,790	32,790	100
		පුහුණු	500	500	499	100
38	**විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළඳපල විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය**	වැටුප්	14,064	14,064	13,309	95
		දීමනා	4,197	4,197	4,052	97
		ගමන් වියදම්	652	456	456	100
		ලිපිද්‍රව්‍ය	82	82	82	100
		සංග්‍රහ වියදම්	42	27	27	100
		දේපල ණය පොලී	175	157	157	100
		පුහුණු ශ්‍රමික බලකායක් බිහිකිරීමේ දැනුවත් කිරීමේ වැඩසටහන්	145	145	144	99
		කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් මෙරට පැමිණි ශ්‍රමිකයන් වැවත සමාජ ගත කිරීමේ වැඩසටහන	50	50	50	100

39	**සමෘද්ධි ගෘහ ආර්ථික ක්ෂුද්‍ර මූල්‍ය ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**	සෞභාග්‍ය නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය	171,947	138,615	74,365	54
		සමෘද්ධි පවුල් ලක්ෂ 2 කේන්ද්‍ර කර ගත් අංග සම්පූර්ණ ගෘහ නේවාසික ආර්ථිකයන් බිහිකිරීම වැඩසටහන	219,800	166,136	143,697	86
		උපදේශන නිලධාරි වැටුප්	4,037	4,037	3,998	99
		උපදේශන නිලධාරි දීමනා	1,213	1,213	1,171	97
		උපදේශන නිලධාරි ගමන් වියදම්	216	126	126	100
		උපදේශන නිලධාරි ලිපිද්‍රව්‍ය	21	21	21	100
		උපදේශන නිලධාරි දේපල ණය පොලී	53	49	49	100
		ආබාධිත දීමනා	146,760	146,760	146,665	100
		වකුගඩු දීමනා	22,710	22,710	22,570	99
		දිස්ත්‍රික් සම්බන්ධීකරණ කටයුතු	255	255	254	100
40	**දේශීය වෛද්‍ය ප්‍රවර්ධන ග්‍රාමීය හා අයුර්වේද රෝහල් සංවර්ධන සහ ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශය**	වැටුප්	4,406	4,406	4,373	99
		දීමනා	1,399	1,399	1,392	99
		ගමන් වියදම්	198	95	95	100
		ලිපිද්‍රව්‍ය	16	16	16	100
		දේපල ණය පොලී	51	51	59	116
		ආයුර්වේද සංග්‍රහ කටයුතු හා පුස්තකාල පහසුකම්	92	92	87	95
41	**වතු නිවාස හා ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය**	පසුගාමී ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම	12,793	11,857	10,677	90
42	**නිපුණතා සංවර්ධන වෘත්තිය අධ්‍යාපන පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය**	ගමන් වියදම්	508	251	251	100

43	දහම් පාසල් පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය	දහම් පාසල් ගොඩනැගිලි ඉදිකිරීම	500	500	0	0
		දහම් පාසල් ගොඩනැගිලි ඉදිකිරීම	3,183	3,183	441	14
44	වී ධාන්‍ය කාබනික ආහාර ඵලවළු පළතුරු මිරිස් එනු හා අර්තාපල් වගා ප්‍රවර්ධනය බීජ නිෂ්පාදන හා උසස් තාක්ෂණ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යාංශය	වැටුප්	2,661	2,467	2,467	100
		කැකුළු තරු උද්‍යාන වැඩසටහන	104	67	67	100
45	පොහොර නිෂ්පාදන හා සැපයුම් රසායනික පොහොර හා කෘමි නාශක භාවිත නිවාමන රාජ්‍ය අමාත්‍යාංශය	අතිකාල දීමනා	29	1	1	100
		ගමන් වියදම්	36	8	8	100
		ඉන්ධන	45	22	22	100
		තැපැල් හා සන්නිවේදන	15	15	0	0
		වෙනත් වියදම්	125	123	123	100
		වෙනත් වියදම් සඳහා	409	409	0	0
		පසු අස්වනු සමීක්ෂණ කටයුතු	99	95	95	100
46	ඉඩම් කළමණාකරණ කටයුතු ,රාජ්‍ය ව්‍යාපාර ඉඩම් හා දේපල සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	බිම් සවිය වැඩසටහන	409	409	390	95

47	**පොල් කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය**	කිතුල් කර්මාන්තයේ අභිවෘද්ධිය	15,548	13,314	1,763	13
48	**උක් බඩ ඉරිගු කඩු ගම්මිරිස් කුරුදු කරාබු නැටි බුලත් ඇතුළු කුඩා භෝග වගා සංර්ධනය ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**	අපනයන කෘෂි කලාප වැඩසටහන	1,348	1,248	1,082	87
		ජල සම්පාදන පද්ධති ඉදිකිරීම*ගස්නාව	21	21	0	0
49	**ග්‍රාමීය හා ප්‍රාදේශිය පානීය ජල සම්පාදන ව්‍යාපෘති සංර්ධන රාජ්‍ය අමාත්‍යාංශය**	ජල ෂෝෂක ප්‍රදේශ ආරක්ෂා කිරීම	140	109	109	100
		සනීපාරක්ෂක පහසුකම්	1,000	230	190	83
50	**ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශය**	ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන	179,000	46,470	11,597	25
51	**විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව**	අතිකාල	72	72	64	89
		ගමන් වියදම්	54	54	46	85
		සිවිල්	115442	115442	115428	100
		තැපැල්	330	330	310	94
		මුද්‍රණ	300	300	265	88
		රජයේ නිළධාරීන්ගේ ණය ශේෂ නිරවුල් කිරීම.	3665	3665	3665	100
		වැන්දඹු අනත්දරු	35761	35761	35752	100
52	**ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව**	විමධ්‍යගත අයවැය	109593	109593	40614	37
		ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති අතැති බිල්	370801	370801	370436	100

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේකාර්ය සාධනය

වත්කම් කේතනය	කේත විස්තරය	31.12.2021 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව ශේෂය	31.12.2021 දිනට මූල්‍ය තත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්ක රණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන	809379945.74	809379945.74		100%
9152	යන්ත්‍රෝපකරණ	323791373.87	323791373.87		100%
9153	ඉඩම්	277513000.00	277513000.00		100%
9154	අස්පෘශ්‍ය වත්කම්			-	
9155	ජීව විද්‍යාත්මක වත්කම්			-	
9160	කෙරීගෙන යන වත්කම්				
9180	බදු දෙන ලද වත්කම්				

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

අමුණා ඇත.

04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

අනු අංකය	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම			
		100%-90%	75%-89%	50%-74%	50%>
1	ඉඩම් සඳහා දීමනාපත්‍ර ලබා දීම	90%			
2	ආබාධ සහිත තරුණ තරුණියන් වෘත්තීය පුහුණුවට යොමු කිරීම	116%			
3	විදුලිය නොමැති පවුල් සඳහා විදුලිය ලබා දීම				24%
4	තරුණ කාන්තා ව්‍යවසායකයින් 25000 ඉලක්ක කර ගෘහස්ථ අලෙවිසැල් ස්ථාපිත කිරීමේ වැඩ සටහන				8%
5	සෞභාග්‍යයේ දැක්ම නිවාස වැඩ සටහන යටතේ විශේෂ නිවාස ඉදිකිරීම රු.200,000				22%

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG)සපුරා ගැනීමේ කාර්ය සාධනය

2021

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
1	1.1	1.1.1- දිළිඳු පවුල් ප්‍රතිශතය	8.6		
	1.4	1.4.2-උප්පැන්න, විවාහ,ඉඩම් හිමිකම් වැනි කරුණු සම්බණ්ධව හිමිකම් නොමැති පවුල් සංඛ්‍යාව	–		
2	2.2	2.2.1 - වයස් අවුරුදු 5ට අඩු මිටි දරුවන් 2.2.2 - වයස අවුරුදු 5ට අඩු කෘෂ/ අඩු බර දරුවන් ප්‍රතිශතය	8.3		
	2.4	2.4.1 - පුරන් කුඹුරු ප්‍රමාණය	19		
3	3.1	3.1 මාතෘ මරණ අනුපාතය	සංඛ්‍යාව-11		
	3.2	3.2.2 - බිළිඳු මරණ	1.85		
	3.3	3.3.2,3.3.3 ක්ෂය, මැලේරියා රෝගීන් සංඛ්‍යාව	සංඛ්‍යාව-191		
4	4.1	4.1.1 දිස්ත්‍රික් පාසල් නොයන හා කඩින් කඩ පාසල් යන දරුවන් ප්‍රතිශතය	0.06		
5	5.2	5.2.1 කාන්තාවන්ට හා ළමයින්ට සිදුවන සියලුම ආකාරයේ හිංසන ප්‍රමාණය (පැමිණිළි සංඛ්‍යාව)	සංඛ්‍යාව-127		
6	6.1	6.1.1 සුරක්ෂිත ජලය පරිහරණය කරන පවුල් ප්‍රතිශතය			88.93
		6.2.1 සනීපාරක්ෂක පහසුකම් සහිත පවුල් ප්‍රතිශතය			92.95
7	7.1	7.1.1 විදුලිය නොමැති පවුල් ප්‍රතිශතය	0.73		
8	8.5	8.5.1 විරැකියා අනුපාතය		59.76	
9	9.1	9.1.1 සංවර්ධනය කරන ලද මුලු මාර්ග ප්‍රමාණය (කි.මී. වලින්)	කි.මී 3863.5		
11	11.1	11.1.1 ස්ථිර නිවාස නොමැති පවුල් ප්‍රතිශතය	1.68		
12	12.5	12.5.1 දිස්ත්‍රික්කය තුල ජනනය වන නොදිරු ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය අවම කිරීම	39.02		
13	13.1	13.1.1 ආපදා හේතුවෙන් මිය යන සංඛ්‍යාව	92		
14	14.1	14.1.1 දිස්ත්‍රික්කයේ ඇති ජල මූලාශ්‍ර සංරක්ෂණය කර ඇති ප්‍රමාණය	190		
15	15.1	15.1.1 වන ආවරණයේ ප්‍රතිශතය	–		
	15.8	15.8.1 ආක්‍රමණශීලී ශාක හා සතුන් ප්‍රතිශතය	–		
16	16.1	16.1.1 හා 16.1.3 කායික හා මානසික හිංසනයට නතු ප්‍රතිශතය (පැමිණිලි සංඛ්‍යාව අනුව)	361		

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව	අතිරික්ත සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ	41	40	1	-
තෘතියික	31	23	8	2
ද්විතියික	1093	1412	-	319
ප්‍රාථමික	109	90	19	-

6.2 . පවතින පුරප්පාඩු හා අතිරික්තතා සම්බන්ධයෙන් ඒකාබද්ධසේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා ඇති අතර, පුරප්පාඩු තනතුරු වල රාජකාරි කටයුතු කරගෙන යාම සඳහා අභ්‍යන්තර වැඩපිළිවෙල සකසා ඇත. (රාජකාරි ආවරණය මඟින්) පුරප්පාඩු වැඩි ප්‍රමාණයක් පවතින්නේ ග්‍රාම නිලධාරි තනතුර සඳහා වන අතර උපාධිධාරී අභ්‍යාසලාභීන් ස්ථීර සංවර්ධන නිළධාරී සේවයට පත් කිරීම මත හා සංවර්ධන නිළධාරී ස්ථාන මාරු කිරීම මත අනුමත සංවර්ධන නිළධාරීන් ප්‍රමාණය ඉක්මවා අතිරික්තයක් ඇති වී ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය		වැඩසටහනේ ස්වාභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම්/ලබාගත් දැනුම
				දේශීය	විදේශීය		
1	පශ්චාත් උපාධි පාඨමාලා සඳහා ගෙවීම්(දිස්ත්‍රික් ලේකම්)	1	2021.01.19	127,000.00		දේශීය	ආයතනයේ සෑම කළමනාකරණ මට්ටමක නිලධාරීන් විසින් සිදු කරනු ලබන විෂයයන්ට අනුව පුහුණු අවශ්‍යතාවය මත පුහුණු වැඩසටහන් දේශීය හා විදේශීය වශයෙන් සහභාගී වී ඇති හෙයින් ලබා ගන්නා දැනුම තුළින් එකී නිලධාරීන් ගේ කාර්ය සාධනය උදෙසා මෙම පුහුණු වැඩසටහන් දායක වේ.
2	ප්‍රසම්පාදනය හා ලංසු ඇගයීම	40	2021.02.16,23, හා මාර්තු 12	49,223.72		දේශීය	
3	internet & e-mail	25	2021.04.07 හා 22	9,335.50		දේශීය	
4	ආකල්ප වර්ධනය හා ඵලදායිතා සංකල්ප පිළිබඳ පුහුණු වැඩමුළුව	80	2021.10.14 හා15	6,952.00		දේශීය	
5	පෙ ෞරුෂත්ව වර්ධනය හා දිස්ත්‍රික්කයට ආවේණික උරුමයන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන (අංගම්පොර)	50	2021.10.22	33,310.00		දේශීය	
6	නවක පරිපාලන සේවා නිලධාරි පුහුණු වැඩසටහන	9	2021.12.03	2,500.00		දේශීය	
7	වන සංරක්ෂණය හා පරිසර කටයුතු පිළිබඳ නේවාසික පුහුණු වැඩසටහන	40	2021.12.07හා 08	148,780.00		දේශීය	

8	integrade treasury management information system (ITMIS)	63	2021.12. 07,8,9හා10	104,280.00		දේශීය	
9	කාර්යාල ක්‍රම හා රාජ්‍ය නිලධාරී නෛතික රාමුව පිළිබඳ දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන	50	2021.12.10	6,590.00		දේශීය	
10	අත්තිකාරම් බිී ගිණුම	45	2021.12.16 හා 24	39,832.50		දේශීය	
11	දැව භාවිතය පිළිබඳ පුහුණු වැඩසටහන	50	2021.12.17	17,225.00		දේශීය	
12	වෙබ් අඩවි යාවත්කාලීන කිරීමේ පුහුණු වැඩසටහන	25	2021.12.21	14,440.00		දේශීය	
13	රජයේ විනය කාර්ය පරිපාටිය පිළිබඳ පුහුණුව	60	2021.12.22	28,052.50		දේශීය	
14	ව්‍යාපෘති සැළසුම්කරණය පිළිබඳ නේවාසික පුහුණු වැඩසටහන	65	2021.12.23 හා 24	303,870.00		දේශීය	
15	ආතති කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන	150	2021.12.30	47,650.00		දේශීය	

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම)	අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්			
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්			
1.6	වෙනත්			
2	පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම **(මූ.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.2	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		

2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
2.6	වෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N 20) යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මුල්‍ය බලතල , ආයතනය තුළ බලතල පවරා දීම	අනුකූල වේ		
3.2	මුල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.01 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේකය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අය වැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂිකමුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		

5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියමකොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම.	අනුකූල නොවේ	ප්‍රාදේශිය ලේකම් කාර්යාල සහ වෙනත් කාර්යාල වලින් පිළිතුරු ගෙන්වා ගැනීමට කාලයක් ගත වීම නිසා නියමිත දිනට පිළිතුරු ලබාදීමට අපහසු වූ අවස්ථා පවතී.	
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව ,වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව , අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	ප්‍රාදේශිය ලේකම් කාර්යාල සහ වෙනත් කාර්යාල වලින් පිළිතුරු ගෙන්වා ගැනීමට කාලයක් ගත වීම නිසා නියමිත දිනට පිළිතුරු ලබාදීමට අපහසු වූ අවස්ථා පවතී.	
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව , අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන යාම.	අනුකූල වේ	කමිටු 01 ක් පවත්වා ඇත.කොවිඩ් තත්ත්වය යටතේ සැලසුමකල පරිදි ඉතිරි කමිටු 03 පැවැත්වීමට නොහැකි විය.	
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		

8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල නොවේ	දිස්තික් ලේකම් කාර්යාලයේ පමණක් කොවිඩ් තත්වය නිසා ප්‍රමාද වී ඇත.. ප්‍රාදේශිය ලේකම් කාර්යාල වල අවසන් කර ඇත.	
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල නොවේ	ඉදිරියේදී නියමිත පරිදි කටයුතු කිරීමට නිළධාරීන් දැනුවත් කර ඇත.	
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල නොවේ	ඉදිරියේදී නියමිත පරිදි කටයුතු කිරීමට නිළධාරීන් දැනුවත් කර ඇත.	
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 216/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල නොවේ	කොවිඩ් තත්වය නිසා ප්‍රමාද වී ඇති අතර නියමිත පරිදි කටයුතු කිරීමට නිළධාරීන් දැනුවත් කර ඇත.	
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුමු ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කල යුකුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	කොවිඩ් තත්වය නිසා ප්‍රමාද වී තිබූ අතර නියමිත පරිදි කටයුතු කිරීමට නිළධාරීන් දැනුවත් කර ඇත.	

11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	වාරික වශයෙන් නිරවුල් වෙමින් පවතී.	
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල නොවේ	වසර කීපයක් තුල විශාල ප්‍රමාණයක් නිරවුල් කර ඇති අතර ඉතිරියද නොපමාව නිරවුල් කිරීමට කටයුතු කරගෙන යනු ලැබේ.	
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්ය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව , රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		

15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	දිස්තික් ලේකම් අනියම් ගණන් දීමේ නිළධාරියෙකු නොවේ.	
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල නොවේ	රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් මත වෙනස් වී ඇත.	
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිළධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පළ කිරීමටපහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවා ලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක නර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවා ලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම් සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්මතුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		

19.3	ඉහත සඳහන් චක්‍ර ලේඛයේ ඇමුණුම 01 හි දැකිවෙන ආකෘතිය පදනම්කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන්කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍ර ලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම,ධාරිතා සංවර්දන වැඩසටහන් සංවර්ධනය කිරීම,නිපුනතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම පවරා ජේ්‍යෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිතුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

විගණකාධිපතිවරයාගේ වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. KGL/A/DSK/2/21/84
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2022 මැයි 18 දින

දිස්ත්‍රික් ලේකම්,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
කෑගල්ල.

ශීර්ෂ 279- කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන විගණන පනතේ 11 (1) වගන්තිය ප්‍රකාරව සම්පිණ්ඩන විගණන වාර්තාව

2021 වර්ෂය සඳහා සහතික කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ ඊට අදාල නිරීක්ෂණ ඇතුලත් සම්පිණ්ඩන විගණන වාර්තාව මේ සමඟ එවා ඇත.

ජේ. සුනිල් ශාන්ත
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත - අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල. ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. KGL/A/DSK/2/21/84 ඔබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2022 මැයි 18 දින

දිස්ත්‍රික් ලේකම්,

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,

කෑගල්ල

කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කල මතය

කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වගන්තිය ප්‍රකාරව කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි 17 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කල මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.1. 1 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ 2021 දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් ප්‍රකාශයේ ශේෂයන් හා භාණ්ඩාගාර SA 82 ආකෘතියේ ශේෂයන් අතර ආරම්භක ශේෂය යටතේ රු.3,067,517 ක ද මිලදී ගැනීම් යටතේ රු.3,550,242 ක ද, අපහරණයන් යටතේ රු.482,727 ක ද නොසැසඳීම් දැක්වුණි.

(ආ) ඒකාබද්ධ ශේෂ පිරික්සුමේ මූලධන වත්කම් අත්පත් කර ගැනීමට අදාල වැය විෂයයන් වූ 2101,2102,2103 හා 2104 හි එකතුව රු.73,336,169 ක් වුවත්, භාණ්ඩාගාර SA 82 ආකෘතිය අනුව, එම අගය රු. 97,002,938 ක් හා මූල්‍ය ප්‍රකාශන සමඟ වූ ස්ථාවර වත්කම් ප්‍රකාශය අනුව එම අගය රු.100,553,180 ක් වශයෙන් වෙනස්කම් පැවතුණි.

1.6.1.2 බැඳීම් හා බැරකම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2021 දෙසැම්බර් 31 දිනට පැවති රු. 937,051 ක බැරකම් දෙසැම්බර් 31 දිනට නිදහස් කර නොතිබියදී මූල්‍ය ප්‍රකාශන සටහන iii හි බැරකම් නිදහස් කිරීම තීරුවට ඇතුලත් කර තිබුණි.

(ආ) ව්‍යාපෘති 2 - ප්‍රාදේශීය පරිපාලනය සඳහා මූලධන වැය විෂයයක් නොතිබියදී මූලධන වියදම් දෙකකට අදාලව රු. 489,490 ක බැරකම් මූල්‍ය ප්‍රකාශන සටහන iii හි දක්වා තිබුණි.

1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

1.6.2.1 මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වෙනත් වැය ශීර්ෂ යටතේ සිදුකල රු.925,954,938 ක මූලධන වියදම්, ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතු වුවද, එම වියදම් මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි.

(ආ) සහනාධාර හා මාරුකිරීම් යටතේ දැක්විය යුතු දේපල ණය පොලී වියදම් වූ රු.7,179,866 ක මුදල පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් යටතේ දක්වා තිබුණි.

1.6.3 අග්‍රිම ගිණුම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

දෙපාර්තමේන්තු පොත් අනුව අග්‍රිම ලැබීම් හා ගෙවීම් අගය රු.5,384,340,247 ක් හා භාණ්ඩාගාර පොත් අනුව එම අගය රු.5,449,700,247 වූයෙන් රු.65,360,000 ක නොසැසඳීමක් විය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 අග්‍රිම කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂයට අදාලව අග්‍රිම සැලැස්ම අනුව ශීර්ෂ 279 ට අදාලව ඉල්ලුම් කිරීමට සැලසුම් කල අග්‍රිමයේ එකතු වටිනාකම රු.මිලියන 3,459 ක් වූ අතර, ශීර්ෂ 279 හා අනෙකුත් අමාත්‍යාංශ දෙපාර්තමේන්තු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුල ඉල්ලුම් කල අග්‍රිමය රු.මිලියන 6,219 ක් වූ අතර, එයින් සමාලෝචිත වර්ෂය තුල ලද අග්‍රිමය රු. මිලියන 4,878 ක් පමණක් විය.

2.2 තැන්පතු

තැන්පතු ගිණුම් හතරක් යටතේ 2021 දෙසැම්බර් 31 දිනට රු.327,747,388 ක ශේෂයක් පැවති අතර ඉන් රු.5,278.855 ක ශේෂයක් පැවති අංක 6000/0/0/2/67 දරණ ටෙන්ඩර් තැන්පතු වලට අදාලව කල් ඉකුත් වූ ශේෂයක් නොපැවති අතර අනෙකුත් ගිණුම් 03 ට අදාලව පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ගිණුම් අංක 6000/0/0/16/19/0 කොන්ත්‍රාත් රැඳවුම් යටතේ වසර 2 ඉක්ම වූ තැන්පතු ශේෂය රු.5,166,140 ක් වූ අතර, එයින් රු.3,815,209 ක් ම වසර 5 ක් ඉක්මවූ ශේෂයන් විය. එම ශේෂය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල වූ අතර, කොන්ත්‍රාත්වල වැඩ අවසන් කර නොතිබීම හා අඩුපාඩු පැවතීම වැනි හේතුවෙන් නිදහස් කර නොතිබූ රැඳවුම් මුදල් විය.

(ආ) ගිණුම් අංක 6000/0/13/37/0 තෙවන පාර්ශවයන් වෙත නැවත ගෙවීම් කිරීම වෙනුවෙන් තාවකාලිකව රඳවාගන්නා තැන්පතු ශේෂය තුල වර්ෂ 2 ක ඉක්මවූ රු.365,018 ක තැන්පතු ශේෂයක් පැවතුණි. අදාල කාර්යය ඉටු නොකිරීම හෝ කාර්යය ඉටුකිරීමෙන් පසු ඉතිරිය අදාල පාර්ශව වෙත නොයැවීම මත වසර 1 ත් 2 ත් අතර රු. 3,877,253 ක තැන්පතු ශේෂයක් වූ අතර, මින් රු.2,029,574 ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට හා රු.1,534,511 ක් දැරණියගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාලව විය.

(ඇ) ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියේදී සම්බන්ධිත ආයතනයන් සමඟ කටයුතු කිරීමෙදී සිදුවන ප්‍රමාදයන් හේතුවෙන් ගිණුම් අංක 6000/0/0/17/0/4 වන්දි ගෙවීම් රු.156,400,553 ක තැන්පතු ශේෂය තුල වසර 1 ත් 2 ත් අතර රු.65,416,687 ක් හා වසර 2ත් 5 ත් අතර රු.19,800,498 ක් හා වසර 5 ට වැඩි රු.31,907,431 ක් පැවති අතර මෙම මුදල් ඉඩම් පවරා ගැනීම් හා වන්දි ගෙවීම් කටයුතු වලට අදාල විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

3.1.1 සැලසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂයට අදාලව අංශ හා සේවාවන් 23 ක් ආවරණය වන පරිදි ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද එකී ක්‍රියාකාරී සැලැස්මෙහි සැලසුම් කරන ලද කාර්යයන්හි ප්‍රගතිය හඳුනාගත හැකි වන පරිදි අදාල සැලැස්මට අනුකූල වන ලෙස ප්‍රගති වාර්තාවක් පිළියෙල කර නොතිබුණි.

3.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම් ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය යටතේ 2019 වර්ෂයේදී අරණායක ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ රු.3,211,954 ක් වැයකර ඉදිකර තිබූ ගොඩනැගිල්ලද, 2018 වර්ෂයේ රු.1,005,930 ක් වැයකර මිලදී ගෙන තිබූ යන්ත්‍ර උපකරණද සමඟ, ඇපලාවත්ත කම්හල් ගොඩනැගිල්ල 2020 මාර්තු 02 දින ඇපලාවත්ත එකමුතු ග්‍රාම ශක්ති ජනතා සමිතිය වෙත කම්හලක් පවත්වා ගෙන යාමට භාරදී තිබුණි. ප්‍රධාන යන්ත්‍රය මඟින් යකඩ තුනී කිරීමද , සෙසු යන්ත්‍ර මඟින් නිමැවුමට අදාල අනෙකුත් කාර්යන්ද සිදුවන මෙම කර්මාන්ත ශාලාවේ වර්තමානය වනවිට ගම්මානයේ කම්හල්කරුවන් සංඛ්‍යාව අඩුවීම, තුනීකල යකඩ සඳහා ඉල්ලුම අඩුවීම වැනි හේතු නිසා යන්ත්‍ර ධාරිතාවයට සාපේක්ෂ නිමැයුමක් ලබා නොගන්නා තත්වයක පැවතුණි. රැස්කල ආදායම් හා වියදම් සහ කම්මල මඟින් සිදුකල කාර්යයන් පිළිබඳ ලේඛන නඩත්තු කර නොතිබීම හේතුවෙන් උපයන ආදායම හා වියදම පිළිබඳව සහ කම්මල මඟින් සිදුකල කාර්යයන් පිළිබඳ තොරතුරු ඉදිරිපත් නොවුණි. එමෙන්ම කම්මල පවත්වාගෙනයාම සම්බන්ධයෙන් මග පෙන්වීමක් හෝ උපදෙස් ලබාදීමක් සහ ප්‍රමාණවත් අධීක්ෂණයක් සිදුවන බවක්ද තහවුරු නොවුණි.

3.2 බැඳීම් හා බැරකම්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ ඉටුකර තිබූ ව්‍යාපෘති සඳහා අග්‍රිම නොලැබීම මත සමාලෝචිත වර්ෂය තුල ගෙවීම් කල නොහැකි වූ රු.257,846,790 ක අතැති බිල්පත් ප්‍රමාණයක් විය.

3.3 නොවිසඳී ඇති විගණන දේද

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාලව ඉකුත් වර්ෂවල විගණකාධිපති වාර්තාවල ඇතුලත් කර තිබූ පසු විපරම් කටයුතු නිමනොවූ විගණන දේද පහත දැක්වේ.

(අ) ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය, ප්‍රජා පාලිත ක්‍රමවේදයක් භාවිතයෙන් පිටු දැකීම අරමුණු කරගත් ජනාධිපති ලේකම් කාර්යාලයේ තිරසර සංවර්ධන අංශය මඟින් හඳුන්වා දී තිබුණු ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය යටතේ ජනතා සමිති ස්ථාපිත කිරීම සඳහා 2018 සහ 2019 වර්ෂවලදී ලද ප්‍රතිපාදන මත පළමු අදියර යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11 තුල ජනතා සමිති 43

ක් වෙත රු. 69,575,200 ක් ද 2019 වර්ෂයේදී දෙවන අදියර යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11 තුල ජනතා සමිති 96 ක් වෙත රු.4,560,000ක් ද ලබාදී තිබුණි. එහෙත් 2020 වර්ෂය අවසානය වනවිට පළමු අදියරේදී ලබාදුන් මුදලින් සියයට 71 ක් ලෙස සමිති 34 ක රු.49,812,357 ක් ද, දෙවන අදියරේදී ලබාදුන් මුදලින් සියයට 96 ක් ලෙස සමිති 96 ක රු.4,358,021 ක් ද අදාල කාර්යය සඳහා යෙදවීමෙන් තොරව එකී සමිතිවල බැංකු ගිණුම්වල නිෂ්කාර්යව රඳවාගෙන තිබුණි.

(ආ) කැගල්ල, වරකාපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා කැගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2009 සිට 2013 කාල පරිච්ඡේදය තුල සිදුව තිබූ විශ්‍රාම වැටුප් වංචාවෙන් තවදුරටත් රු.16,765,760 ක මුදලක් අයකරගැනීමට පැවති අතරම ඊට අදාල දෙපාර්තමේන්තු විනය කටයුතු හා අධිකරණමය කටයුතු සිදුවෙමින් පැවතුණි.

(ඇ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ රු.48,942,000 ක ඇස්තමේන්තුවක් මත 2014 ඔක්තෝබර් මස වැඩ ආරම්භ කර තිබූ වරකාපොල බස් නැවතුම්පොළ හා සාප්පු සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතිය ඉදිකිරීම භූමියේ භිමිකාරිත්වය පිළිබඳ ගැටළු මත 2015 අගෝස්තු 31 දින ලද අධිකරණ වාරණ නියෝගයක් හේතුවෙන් රු.15,189,389 ක කළ වැඩ වටිනාකමකින් අනතුරුව ව්‍යාපෘතියේ ඉදිකිරීම් නතර කර තිබුණි.

3.4 වෙනත් නිරීක්ෂණ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කැගල්ල දිස්ත්‍රික්කයේ 2016 සිට 2019 වර්ෂයන්හි ඇති වූ නාය යෑමෙන් හා නාය යෑමේ අවදානම තත්වය හේතුවෙන් විපතට පත්වූ පවුල් නැවත පදිංචි කිරීමේ ව්‍යාපෘතිය යටතේ එක් පවුල් ඒකකයක් වෙනුවෙන් පෞද්ගලික ඉඩමක නැවත පදිංචි වීමේදී රු. 1,600,000 ක්ද රජයේ ඉඩමක පදිංචි වීමේදී රු.1,200,000 ක්ද බැගින් වූ වන්දි මුදල් ගෙවීමට අනුමත වී පැවතුණි. එහෙත් නිවාසලාභීන් විසින් තම නිවාස ප්‍රමිතියට ඉදිකර නොනිමීම , වැඩ අවසන් නොකිරීම වැනි හේතු මත විගණනයේදී සිදුකල නියැදි පරීක්ෂාවන්ට අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 කට අදාලව වන්දිලාභීන් 190 දෙනෙකු වෙත ගෙවිය යුතුව පැවති වන්දි මුදල රු.76,278,000 ක් විය.

(ආ) කැගල්ල දිස්ත්‍රික් ලේකම්ගේ අංක SDK/EST/ADM/SOSER/D15/01/11 හා 2018 ජූනි 14 දිනැති ලිපිය අනුව කැගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ආබාධ සහිත වූවන්ගේ ස්වශක්ති සංවිධානය හා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ඒකාබද්ධ වැඩසටහනක් වශයෙන් අඩු ආදායම්ලාභී ආබාධිත පුද්ගලයන් 300 ක් සඳහා නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමටත්, මේ යටතේ නව නිවසක් සඳහා රු.ලක්ෂ 5 ක උපරිමය බැගින්ද , අර්ධ නිවාස සඳහා රු. ලක්ෂ 2 ක උපරිමය බැගින්ද, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් ආධාර ලබාදීමටත් සැලසුම් කර තිබුණි. ව්‍යාපෘතිය යටතේ හඳුනාගෙන තිබූ නිවාස ප්‍රතිලාභීන් 381 දෙනා වෙත 2020 ජූනි 21 දින දක්වා ගෙවා ඇති මුදල රු.23,710,000 ක් පමණක් වූ අතර, තවදුරටත් ගෙවීමට ඇති ආධාර මුදල රු.95,690,000 ක් විය. එමෙන්ම මෙම නිවාස වැඩසටහන සඳහා දිස්ත්‍රික්කය තුල සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ආවරණය වන පරිදි 2018 පෙබරවාරි මාසයේදී කොඩි අලෙවි කිරීමේ වැඩසටහනක් සිදුකර එමඟින් රු.7,362,647 ක් රැස් කර එය ආබාධ සහිත තැනැත්තන්ගේ දිස්ත්‍රික් ස්වශක්ති බල මණ්ඩලයේ අංක 81044854 දරන ගිණුමට (ස්වශක්ති අරමුදල) බැර කර තිබුණි. මෙකී මුදල්ද 2022 අප්‍රේල් 30 දක්වාම අදාළ කාර්යයන් සඳහා භාවිතා කර නොතිබුණි. නිවාස ආධාර ලබාදීමේ ප්‍රගතිය දුර්වල මට්ටමක පැවතීම හේතුවෙන් ප්‍රතිලාභීන් විසින් නිවාස ඉදිකිරීමද දුර්වල මට්ටමක පැවති අතර නිවාස 381 ක් අතුරින් සම්පූර්ණයෙන් වැඩ අවසන් කර පැවතියේ නිවාස 03 ක පමණක් විය.

(ඇ) විදාතා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය විසින් ගමට තාක්ෂණය ගෙනයාමේ අරමුණින් ආරම්භ කර තිබූ විදාතා වැඩසටහන යටතේ කැගල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11 සඳහා 2005 වර්ෂයේදී විජලන යන්ත්‍ර , බෙකරි උදුන්, යෝගට් ඉන්කියුබේටර්, පොල්තෙල් නිස්සාරණ යන්ත්‍ර වැනි භාණ්ඩ වර්ග 09 ක් යටතේ භාණ්ඩ ඒකක 68 ක් ලබාදී තිබුණි. එකී කාලයට අදාලව (2005 සිට 2020) විදාතා වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා කැගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ප්‍රමාණවත් සම්බන්ධීකරණයක් සිදුකර ඇති බවට හඳුනාගත නොහැකි විය. ප්‍රාදේශිය ලේකම් කාර්යාල මට්ටමින් පවතින විදාතා මධ්‍යස්ථානවලින් ලබාගත් තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය වනවිට එකී භාණ්ඩවලින් භාණ්ඩ ඒකක 11 ක් වෙන්දේසි කරද , භාණ්ඩ ඒකක 5 ක් වෙනත් පාර්ශව වෙත ලබාදීද, භාණ්ඩ ඒකක 4 ක් විනාශවීද, පැවති අතර ඉතිරි භාණ්ඩ ඒකක 48 ම අභාවිතව හෝ නිෂ්කාර්යව පැවති අතර, වර්තමානය වනවිට ව්‍යාපෘතිය ක්‍රියාකාරී මට්ටමක නොවීය.

4. තිරසර සංවර්ධනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

දිස්ත්‍රික්කයට හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අදාල වන පරිදි තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක නිශ්චිතව හඳුනාගෙන ඒ අනුව එම අරමුණු හා ඉලක්ක සපුරා ගැනීම පිලිබඳ තොරතුරු පද්ධතියක් නොවූ අතර දිස්ත්‍රික්කය තුල සිදුකරනු ලබන සංවර්ධන ව්‍යාපෘතීන් ඒ ඒ තිරසර සංවර්ධන අරමුණුවලට අදාලව ඒ ඒ වර්ෂවලට අදාල තත්ත්වයන් පමණක් හඳුනාගෙන තිබීම හේතුවෙන් කාලානුරූපීව තිරසර සංවර්ධන අරමුණුවලට ලභාවීමේ ප්‍රගතියක් හඳුනාගත නොහැකි විය.

5. මානව සම්පත් කළමනාකරණය

5.1 අනුයක්ත කාර්ය මණ්ඩලය, තත්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි වියදමට අදාල පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් (ශීර්ෂ 279) වැටුප් ලබන කාර්ය මණ්ඩලය ග්‍රාම නිලධාරීන් හා ස්ථීර සංවර්ධන නිලධාරීන් කොටසක් ඇතුළුව 1566 දෙනෙකු පමණ වූ අතර , ඊට අදාල සමාලෝචිත වර්ෂයේ වැටුප් හා දීමනා වියදම රු.මිලියන 696 ක් පමණ විය. ඉන් ජ්‍යෙෂ්ඨ මට්ටම යටතේ අරණායක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහකාර ප්‍රාදේශීය ලේකම් තනතුරද, තෘතීය මට්ටම යටතේ තනතුරු නාම 3 කට අදාලව පුරප්පාඩු 10 ක් ද පැවතුණි. එමෙන්ම ද්විතීයික මට්ටම යටතේ තනතුරු නාම 06 කට අදාලව පුරප්පාඩු 98 ක් පැවති අතර එයින් 79 ක්ම ග්‍රාම නිලධාරීන්ට අදාල වූ අතර ප්‍රාථමික මට්ටම යටතේ තනතුරු නාම 4 කට අදාලව පුරප්පාඩු 17 ක් විය. තෘතීයික මට්ටම යටතේ සංවර්ධන නිලධාරි තනතුරු 109 ක් අනුමතව පැවතියද , සත්‍ය ප්‍රමාණය 525 ක් වූයෙන් නිලධාරීන් 416 ක අතිරික්තයක් විය.

(ආ) වැය ශීර්ෂ 130 හා 409 න් වැටුප් හා දීමනා ලබන ස්ථීර හා පුහුණුලාභී සංවර්ධන නිලධාරීන් 3120 දෙනෙකු පමණ දිස්ත්‍රික්කයට අදාලව අනුයුක්තව පැවති අතර ඒ වෙනුවෙන් වූ වැටුප් හා දීමනා වියදම රු. මිලියන 1,057 ක් පමණ විය. එමෙන්ම 334 වැය ශීර්ෂයෙන් දීමනා ලබන බහුකාර්ය සහයක පුහුණුලාභීන් 1798 දෙනෙකු පමණ, කෑගල්ල දිස්ත්‍රික්කය තුල අනුයුක්තව සිටි අතර එම දීමනා වියදම රු.මිලියන 489 ක් පමණ විය. මීට අමතරව වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වැය ශීර්ෂ යටතේ වැටුප් ලබන ක්ෂේත්‍රගත සංවර්ධන නිලධාරීන් 643 දෙනෙකු පමණ කෑගල්ල දිස්ත්‍රික්කයට අනුයුක්ත කර තිබුණි.

ජේ.සුනිල් ශාන්ත

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට